(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 11(3).]

# පාර්ලිමේන්තුවේ අංක 11 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2014 මැයි මස 23 වැනි සිකුරාදා**

## 2014 ජූනි මස 03 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනාක්‍රම පනතේ 29 වැනි වගන්තිය යටතේ ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 මාර්තු 14 දිනැති අංක 1853/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.05.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග (අංක 1),— 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 නොවැම්බර් 30 දිනැති අංක 1734/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.05.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග (අංක 2),— 2006 අංක 23 දරන පනතින් සංශෝධිත 1998 අංක 53 දරන ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනතේ 37 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 නොවැම්බර් 30 දිනැති අංක 1786/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.05.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2014 ජූනි මස 17 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3733/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සවුදි අරාබියේදී ගෙල සිඳීමේ දඬුවමට හසුව මියගිය මුත්තූර්හි, බාලවයස්කාර රිසානා නාෆික් නමැති පාසල් ශිෂ්‍යාව රවටා ව්‍යාජ ගුවන් ගමන් බලපත්‍ර ඇතුළු ලියකියවිලි සාදා විදේශගත කිරීමේ වරද හේතුවෙන් ලියාපදිංචිය අහෝසි කළ "ඔමාර් ට්‍රැවල්ස්" නමැති රැකියා ඒජන්සිය නැවත "ඔමල්කා ට්‍රැවල්ස්" යන නාමයෙන් ලියාපදිංචි වී ඇති බව දන්නේද;

(ii) අසාධු ලේඛනගතවූ "ඔමාර් ට්‍රැවල්ස්" ඒජන්සිය එම අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ ම වෙනත් නමකින් ලියාපදිංචි කිරීමට අවසරදීමට හේතු කවරේද;

(iii) එවැනි අවසරදීමක් සිදුකිරීම හේතුවෙන් කූට ඒජන්සිකරුවන් තව තවත් අපරාධවලට පෙලඹෙන බවත්, ව්‍යාජ ලිපිලේඛන සෑදීමට බිය නොවන බවත් පිළිගන්නේද;

(iv) එසේ නම්, එම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ජූනි මස 18 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2622/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2009, 2010 සහ 2011 යන වර්ෂයන්හිදී උතුරු වසන්තය වැඩසටහන යටතේ, උතුරු පළාතේ ක්‍රියාත්මක වූ වැඩසටහන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත වැඩසටහන් සඳහා,

(i) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වැය කළ මුදල;

(ii) විෂය මට්ටමින් වැය කළ මුදල;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) උතුරු පළාතේ සංවර්ධනය සඳහා ඉහත වැඩසටහන් ප්‍රමාණවත්වේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3152/'12

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ඔලුවිල් වරායේ සම්පූර්ණ ඉදිකිරීම් පිරිවැය කොපමණද;

(ii) අඛණ්ඩව මූල්‍යමය අලාභ ලබමින් සිටින ශ්‍රී ලංකා වරාය අධිකාරියට තරගකාරී විය හැකිද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2007 වර්ෂයේ සිට මේ දක්වා එක් එක් වර්ෂය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රාග්ධන සහ සාමාන්‍ය සංචිත විචලනයන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3213/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහනුවර මහ නගර සභාව මගින් එක්රැස් කරන කැළිකසළ හා ඝන අපද්‍රව්‍ය හාරිස්පත්තුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි ගොහාගොඩ නමැති ස්ථානයට බැහැර කරනු ලබන බවත්;

(ii) එම අපද්‍රව්‍ය මහවැලි ගඟට එකතුවීමෙන් ප්‍රදේශයේ පානීය ජලය අපවිත්‍රවීම හා දුර්ගන්ධය හේතුවෙන් ප්‍රදේශවාසීන් විවිධ රෝගී තත්ත්වයන්ට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මහනුවර මහ නගර සභාව මගින් කැළිකසළ විධිමත් ලෙස කළමනාකරණය කොට එය සම්පතක් බවට පත්කර ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3447/'13

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා සපුරා තිබිය යුතු අවම සුදුසුකම් කවරේද;

(ii) උතුරු මැද පළාතේ එක් එක් අධ්‍යාපන කලාපයේ සේවය කරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත (i) හි සඳහන් සුදුසුකම් නොමැතිව සේවය කරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් සහ සේවය කරන අධ්‍යාපන කලාප කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු මැද පළාතේ සේවය කරන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I, II, සහ III ශ්‍රේණිවලට අයත් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ දැනට සේවය කරන ස්ථාන කවරේද;

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා සුදුසුකම් නොමැතිව එම පළාතේ සේවය කරන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් සහ සේවය කරන අධ්‍යාපන කලාප කවරේද;

(v) ඉහත තනතුර සඳහා සුදුසුකම් නොමැති පුද්ගලයින් පත්කිරීමේ පදනම කවරේද;

(vi) සුදුසුකම් නොමැති පුද්ගලයන් විසින් තමාට හිමි නැති තනතුරකට ඉහත පරිදි පත්වී අයථා ලෙස දීමනා ලබා ගෙන ඇත්නම්, එම මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3688/'13

ගරු අනුර දිසානායක මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 සහ 2012 වර්ෂ දෙකම සඳහා පැවැත්වූයේ එක් රාජ්‍ය නාට්‍ය උළෙලක් බවත්;

(ii) වාර්ෂිකව පැවැත්විය යුතු එම උළෙල ඉහත සඳහන් පරිදි වර්ෂ දෙකකට වරක් පැවැත්වීමට හේතුව මුදල් නොමැතිකම බවත්;

යන්න එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි පැවැත්වූ රාජ්‍ය නාට්‍ය උළෙල සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් වියදම් කළ ආකාරයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය අනුග්‍රහය මත නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේ පැවැත්වූ "මහ සමයම" ප්‍රසංගයට වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් ලැබුණු ආකාරය කවරේද;

(iii) එම ප්‍රසංගයේ එක් එක් කටයුතු වෙනුවෙන් එම මුදල් වියදම් කළ ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4313/'13

ගරු තිස්ස අත්තනායක මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) උඩවලව, යාල, විල්පත්තුව, වස්ගමුව, ගල්ගමුව හා අනුරාධපුර ආදී ප්‍රදේශවල ජීවත් වන ජනතාව තවමත් වන අලින්ගේ ප්‍රහාරවලට ලක්වන බවත්;

(ii) වන අලින්ගෙන් සිදුවන උවදුරුවලින් එම ප්‍රදේශවල ජනතාව බේරා ගැනීමේ පිළියමක් ලෙස 2002 වර්ෂයේ සිට විදුලි වැටවල් නඩත්තු කිරීම, වන අලි පලවා හැරීම, දඩයම්කරුවන් හා දඩමස් අලෙවි කරන්නන් නීතිය හමුවට ගෙන ඒම ආදී කටයුතු සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය සඳහා අනියම් කම්කරුවන් ලෙස පුද්ගලයින් බඳවා ගත් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(ii) හි පරිදි බඳවා ගෙන ඇති සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) 2013.01.01 දින සිට එම සේවකයින්ගේ සේවය අත්හිටුවා ඇති බැවින් එම ප්‍රදේශවල වන අලින්ගෙන් සිදුවන අනතුරු නැවත වර්ධනය වී ඇති බවත්, රැකියා අහිමි වූ එම පිරිස දැඩි අපහසුතාවයකට පත්වී ඇති බවත් පිළිගන්නේද;

(iii) එසේ නම්, එම සේවකයින්ට නැවත සේවය ලබාදී, ස්ථිර සේවයේ පිහිටුවා, එම ප්‍රදේශවල පවතින වන අලි ගැටලුව විසඳීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4318/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ ජනතාවගේ සාක්ෂරතාවය පිළිබඳව අවසන්වරට සමීක්ෂණයක් කරනු ලැබූ වර්ෂය කවරේද;

(ii) නැගෙනහිර පළාතේ මුළු ජනගහනයෙන් කියවීමේ හා ලිවීමේ හැකියාව ඇති ගැහැනු හා පිරිමි ජනගහනයේ ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ වයස අවුරුදු 10 දක්වා වූ දරුවන් අතරින් ප්‍රාථමික අධ්‍යාපනය සඳහා යොමු නොවූ දරුවන් සංඛ්‍යාව කොපමණද?

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත විමසා ඇති සංඛ්‍යාත්මක අගයන් ප්‍රමාණවත් මට්ටමක පවතින බවට අධ්‍යාපන බලධාරීන් විසින් පිළිගන්නේද;

(ii) කියවීමේ හා ලිවීමේ හැකියාව අඩුවීමට බලපා ඇති බවට හඳුනාගෙන ඇති හේතු කවරේද;

(iii) එම තත්ත්වය වෙනස් කිරීම සඳහා ක්‍රියාත්මක කරන වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4413/'13

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පානීය ජල ව්‍යාපෘති සඳහා වර්ෂය පුරා අඛණ්ඩව ජලය සැපයීම සඳහා මා ඔයෙහි ජලය යොදා ගැනීමේ අරමුණින් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මාවනැල්ල නගරයට ආසන්නව එම ඔය හරස්කර ඉදිකිරීමට යෝජනා කර ඇති ජලාශ ව්‍යාපෘතියේ ඉදිකිරීම කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(ii) එම ව්‍යාපෘතිය සඳහා වැයවන මුදල කොපමණද;

(iii) එම මුදල සපයා ගැනීමට අපේක්ෂා කරන ක්‍රමවේදය කවරේද;

(iv) ණය ආධාරයක් ලෙස එම මුදල සපයා ගන්නේ නම්, ණය පොලී අනුපාතය කවරේද;

(v) එම ණය මුදල ලබා ගන්නා ආයතනය කවරේද;

(vi) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ගතවන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4433/'13

ගරු තලතා අතුකෝරල මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඉන්දීය ආරක්ෂක අමාත්‍යවරයා විසින් ලොක් සභාවේදී සිදුකර ඇති ප්‍රකාශයකට අනුව ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවෙන් අවි මිලදී ගැනීමක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම අවි ගනුදෙනුව සිදු කර ඇති දින වකවානු කවරේද;

(iii) ඉන්දියාව විසින් එසේ මිලදී ගනු ලැබ ඇති ආයුධ වර්ග කවරේද;

(iv) එම ආයුධ අලෙවි කිරීම මගින් ශ්‍රී ලංකාව ලැබූ ආදායම කොපමණද;

(v) එම ගනුදෙනුවල විනිවිදභාවය තහවුරු කෙරෙන වාර්තාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4587/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ නගරය තුළ "කැසිනෝ" කිහිපයක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2013.11.29 දිනවන විට කොළඹ නගරය තුළ ක්‍රියාත්මක වූ "කැසිනෝ" සංඛ්‍යාව සහ ඒවායේ ලියාපදිංචි නම් කවරේද;

(ii) 2006 වර්ෂයේ සිට 2012 දක්වා සහ 2013 වර්ෂයෙහි මුල් කාර්තු තුන සඳහා ඉහත එක් එක් ආයතනය විසින් ගෙවිය යුතු වාර්ෂික බදු අයකිරීම් සහ වෙනත් ගාස්තු කවරේද;

(iii) ඉහත එක් එක් ආයතනය විසින් ඉහත කී කාල පරිච්ඡේදය සඳහා ගෙවන ලද වාර්ෂික බදු, අයබදු සහ වෙනත් සියලු ගාස්තු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4749/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මධ්‍යම රජය විසින් නඩත්තු කරනු ලබන මාර්ගවල දිග ප්‍රමාණය කොපමණද;

(ii) පළාත් සභා විසින් නඩත්තු කරනු ලබන මාර්ගවල දිග ප්‍රමාණය කොපමණද;

(iii) ප්‍රාදේශීය සභා විසින් නඩත්තු කරනු ලබන මාර්ගවල දිග ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මධ්‍යම රජය විසින් නඩත්තු කරනු ලබන මාර්ග අතරින් මේ වන විට කාපට් අතුරා ඇති මාර්ගවල දිග ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2627/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා මේ වන විට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) වර්ෂ 2005 සිට 2011 දක්වා ධීවර ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් කරන ලද මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වෙන් කරන ලද මුදල් ඒ ඒ වර්ෂ සඳහා ප්‍රමාණවත් වූයේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3149/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවල රජය විසින් ලබාගත් ණය මුදල් හා ඒවායේ ආපසු ගෙවීමේ කාල සීමාවන් වාර්ෂික පදනමින් කවරේද;

(ii) ආදායම් උත්පාදනය කර ණය ආපසු ගෙවන ආකාරය ඇතුළුව මුදල් ප්‍රවාහ ප්‍රකාශ කවරේද;

(iii) පැරණි ණය ගෙවීම සඳහා රජය තව තවත් ණය ගැනීම සිදු කරන්නේද;

(iv) ඉහත (i) හි දක්වා ඇති කාල සීමාවන්හිදී ලබා ගෙන ඇති ණය සඳහා පිරිවැය ඉක්මවා ලැබූ ආදායමේ වර්ධනය කොපමණද;

(v) රට ණය උගුලක් කරා ගමන් කරමින් සිටින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2009 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය ණය, රජයේ බැඳුම්කර යනාදිය හරහා ඇ.එ.ජ ඩොලර් මිලියන 500 ඉක්මවා ණයට ගෙන ඇති අවස්ථා කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3218/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, ගලගෙදර, තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් ඉවත් කරන ලද කැළිකසළ හා ඝන අපද්‍රව්‍ය පූජාපිටිය ප්‍රාදේශීය සභාවට අයත්, දික්ඔයවත්ත නමැති ඉඩමට බැහැර කරන බවත්;

(ii) බැහැර කරන අපද්‍රව්‍ය එම ප්‍රදේශයේ ජලයට එකතුවීම නිසා අවට ජනතාව රෝගී තත්ත්වයන්ට මුහුණපා ඇති බවත්;

(iii) අපද්‍රව්‍ය මෙම ස්ථානයට ගෙන ගොස් දැමීම නතර කරන ලෙස අදාළ බලධාරීන් දැනුවත් කළද මේ දක්වා විසඳුමක් නොලැබුණු බවට ප්‍රදේශවාසීන් චෝදනා කරන බවත්;

(iv) කැළිකසළ ප්‍රවාහනය කිරීම හේතුවෙන් අවට මාර්ග කිහිපයක්ද මේ වන විට විනාශ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කසළ ප්‍රවාහනය නිසා විනාශ වූ මාර්ග සංවර්ධනය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඉවතලන කැළිකසළ ඉහත සඳහන් ස්ථානයට බැහැර කිරීම නතර කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3701/'13

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජයට බදු ගෙවනු ලබන රාජ්‍ය හා පුද්ගලික ඉන්ධන අලෙවි සමාගම් කවරේද;

(ii) පසුගිය වර්ෂ 10 තුළ එම එක් එක් සමාගම වාර්ෂිකව ගෙවන ලද බදු ප්‍රමාණයන් එක් එක් බදු වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බදු ගෙවීමේදී කවර හෝ සමාගමක් සඳහා, කවර හෝ බදු නිදහසක් ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම සමාගම්වල නම් කවරේද;

(v) එවන් බදු සහනයක් ලබාදීමට හේතු කවරේද;

(vi) පසුගිය වර්ෂ දහය තුළ එම බදු සහනය ලබාදීම නිසා ශ්‍රී ලංකා රජය වෙත අහිමි වී ඇති බදු මුදල් ප්‍රමාණය එක් එක් බදු වර්ගය අනුව, වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2014 ජූනි මස 19 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2642/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) උතුරු හා නැගෙනහිර පළාත්වල කාන්තාවන් විසින් මූලිකත්වය දරනු ලබන පවුල්වලට සුදුසු ආර්ථික ක්‍රියාවලියකට යොමු වීම සඳහා එක් පවුලකට රුපියල් ලක්ෂ 2කට නොවැඩි වූ ණය මුදලක් සහන පොලියක් යටතේ ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම ණය මුදල් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3236/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට පවතින ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3591/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට භාවිතා කරනු ලබන දුරකථන සංඛ්‍යාව රටේ මුළු ජනගහනයටත් වඩා වැඩි බවට පළවන වාර්තා පිළිගන්නේද;

(ii) මේ වන විට දිවයින තුළ පරිහරණය කරනු ලබන ජංගම සහ ස්ථාවර දුරකථන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා ආනයනය කර ඇති ජංගම සහ ස්ථාවර දුරකථන සංඛ්‍යාව කොපමණද;

(ii) ගෙන්වනු ලැබූ රටවල් අනුව එම දුරකථන සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා වැය කරන ලද මුළු විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ගෙවුම් ශේෂ ලේඛනයෙහි හිඟය කෙරෙහි දුරකථන ගෙන්වීම සඳහා වැයවන විදේශ විනිමය දැඩි බලපෑමක් ඇති කරවන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එම තත්ත්වය පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) රට තුළට ප්‍රමිතියෙන් තොර දුරකථන ගෙන්වනු ලබන බව දන්නේද;

(iv) එය නැවැත්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3699/'13

ගරු අනුර දිසානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2013 පෙබරවාරි මාසය තුළ පෙට්‍රල් මෙට්‍රික් ටොන් එකක් ආනයනය කරන ලද සාමාන්‍ය මිල (CIF VALUE);

(ii) මෙට්‍රික් ටොන් එකක ආසන්න වශයෙන් අඩංගු පෙට්‍රල් ලීටර් සංඛ්‍යාව;

(iii) ඒ අනුව 2013 පෙබරවාරි මාසය තුළ පෙට්‍රල් ලීටරයක් වරායෙන් ගොඩබාන විට තිබූ සාමාන්‍ය මිල;

(iv) පෙට්‍රල් ලීටරයක් වෙනුවෙන් රජය විසින් අය කරනු ලබන එක් එක් බදු ප්‍රමාණයන්;

(v) පෙට්‍රල් ලීටරයකින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබන ලාභය;

(vi) පෙට්‍රල් ලීටරයක් බෙදා හැරීමේ වියදම හා අලෙවි කිරීම මගින් පිරවුම් හල ලබන ලාභය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3827/'13

ගරු පී. හැරිසන් මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දියතිත්තවැව මාර්ගයේ නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකර තිබේද;

(ii) එම එක් නිවසක් ඉදිකර ගැනීමට නිවාසලාභියකුට ලබා දුන් මුදල කොපමණද;

(iii) එම මුදල ලබා දුන්නේ ආධාර වශයෙන්ද; නැතහොත්, ණය මුදලක් වශයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම නිවාසලාභීන්ට,

(i) ලබා දී ඇති ඉඩම් කට්ටියක වර්ග ප්‍රමාණය කවරේද;

(ii) එම ඉඩම්වල සින්නක්කර අයිතිය ලබා දී තිබේද;

(iii) පානීය ජල අවශ්‍යතාවය සපුරාලීමට වැඩපිළිවෙළක් සකස්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම යෝජනා ක්‍රමයේ,

(i) ඉදිකර ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට පදිංචිය සඳහා ලබා දී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට පදිංචි නොවී ඇති නිවාස සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4335/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I, II, සහ III යන පන්තිවල පවතින තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තිය සඳහා නිලධාරීන් බඳවා ගැනීමට පවත්වනු ලබන විවෘත තරග විභාගය අවසන් වරට පැවැත්වූ දිනය කවරේද;

(iii) එම විභාග ප්‍රතිඵල මත නිලධාරීන් තෝරා පත්කළ දිනය කවරේද;

(iv) එම අවස්ථාවේදී ලබාදුන් පත්වීම් සංඛ්‍යාව කොපමණද;

(v) එම පත්වීම් ලද නිලධාරීන් අතර සිටි කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III පන්තිය සඳහා නිලධාරීන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන සීමිත තරග විභාගය අවසන් වරට පවත්වනු ලැබූ දිනය කවරේද;

(ii) එම විභාග ප්‍රතිඵල මත නිලධාරීන් බඳවා ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, නිලධාරීන් බඳවා ගැනීමට අපේක්ෂිත දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4508/'13

ගරු අබ්දුල් හලීම් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ පහළොවකට ආසන්න කාලය තුළ විවිධ අවස්ථාවලදී වර්ෂාව නිසා අකුරණ නගරය ජලයෙන් යට වූ බවත්;

(ii) නගරය ජලයෙන් යටවීම හේතුවෙන් ව්‍යාපාර ස්ථානවලට හා නගරවාසීන්ට අතිවිශාල අලාභයක් සිදු වී ඇති බවත්;

(iii) අකුරණ නගරය ජලයෙන් යට වූ අවස්ථාවලදී යාපනය - මහනුවර මාර්ගය (A9) භාවිතා කිරීමට නොහැකි වූ බවත්;

(iv) 1997 වර්ෂයේදී අකුරණ නගරය ජලයෙන් යට වූ අවස්ථාවේදී නිලධාරීන්ගේ උපදෙස් අනුව නගරය ඔස්සේ ගලා යන ඇළ මාර්ගය අවහිර වන ලෙස ඉදිකර තිබූ ගොඩනැගිලිවල කොටස් ඉවත් කළ බවත්;

(v) අකුරණ මහ පල්ලියේ සහ ප්‍රදේශවාසීන්ගේ ආධාරයෙන් රුපියල් මිලියන 5ක පමණ වියදමෙන් එකී ඇළ මාර්ගයේ රොන් මඩ දෙවතාවක් ඉවත් කළ බවත්;

(vi) එමෙන්ම ඇළට යාබදව තිබූ සියලුම ලී මෝල් ඉවත් කරන ලද බවත්;

(vii) එසේ වුවද, 2013 ඔක්තෝබර් මස 31 වැනි දින ඇද හැලුණු වර්ෂාවෙන් අකුරණ නගරය නැවත ජලයෙන් යට වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) අකුරණ නගරය ජලයෙන් යට වීමේ ගැටලුව විසඳීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ මූලිකත්වයෙන්, අනෙකුත් අමාත්‍යාංශ ද සම්බන්ධ කර ගෙන යම් අධ්‍යයනයක් කර තිරසාර පිළියමක් යෙදීමට ක්‍රියා කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4588/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුදු බඳු සහ අනෙකුත් ආශ්‍රිත බඳු ගෙවීම පිණිස "මරීනා කලම්බු" හෝ වෙනත් සමාන නමකින් "කැසිනෝ" ආයතනයක් ලියාපදිංචි කොට තිබේද;

(ii) එම ආයතනය පළමු වරට ලියාපදිංචි කොට තිබෙන්නේ කවදාද;

(iii) ඉහත කී කැසිනෝ ආයතනය ලියාපදිංචි කොට තිබෙන්නේ කවර නාමයක් (පුද්ගලයකු හෝ සමාගමක්) යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4598/'13

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයඹ පළාතේ, පුත්තලම අධ්‍යාපන කලාපයට අයත්, වප/පු/කොයියාවඩි මුස්ලිම් මහ විදුහලේ විද්‍යාව සහ ගණිතය යන විෂයයන් සඳහාත්, ප්‍රාථමික අංශයටත් අවශ්‍ය ගුරුවරුන් නොමැති බවත්;

(ii) එම තත්ත්වය එකී පාසලේ ශිෂ්‍යයින්ගේ අධ්‍යාපන කටයුතුවලට බාධාවක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම පාසලට අවශ්‍ය ගුරුවරුන් නොපමාව ලබා දීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4652/'13

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ගම්පහ දිස්ත්‍රික්කය හැර අනෙකුත් ප්‍රදේශවල ඇති ඩිපෝ සහ වෙනත් භූමි තුළ ධාවනයේ නොයොදවා ගාල් කර ඇති බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ ධාවනයෙන් ඉවත් කර තැබීමට හේතු කවරේද;

(iii) ඉන් කොපමණ ප්‍රමාණයක් නැවත ධාවනයේ යෙදවිය හැකි තත්ත්වයක පවතින්නේද;

(iv) එසේ ධාවනය කළ හැකි බස් රථ අලුත්වැඩියා කළ යුතු නම්, ඒ සඳහා වැයවන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4752/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල, මල්ලවපිටිය සිට රිදීගම දක්වා මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කරන්නේද;

(ii) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2647/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන්වන පරිදි දිවයිනේ විවිධ ප්‍රදේශවල සිටින ඉඩම් නොමැති රජයේ සහ සංස්ථා සේවකයින්ට නිවාස ඉදිකර ගැනීම සඳහා පර්චස් 10කට නොඅඩු ඉඩම් කැබලි 25,000ක් බෙදා දී තිබේද;

(ii) එසේ නම්, මේ වන විට එලෙස ඉඩම් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3237/'12

ගරු රවි කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා සතොස ආයතනයට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට පවතින ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3651/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩකර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩකිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩකිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවසර ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3714/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2010, 2011 සහ 2012 වර්ෂවලදී ජනාධිපති අරමුදලින් අධ්‍යාපන ආධාර ලබා දීම සඳහා සුදුස්සන් තෝරා ගනු ලැබූ පදනම කවරේද;

(ii) ඒ අනුව පසුගිය වර්ෂ 03 ක කාලය තුළ අධ්‍යාපන ආධාර ලබා දීම සඳහා තෝරා ගන්නා ලද සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආධාරලාභීන්ගේ නම් සහ එක් එක් පුද්ගලයාට ලබා දුන් ආධාර මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2014 ජූනි මස 20 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2652/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි ප්‍රධාන නගර 25ක තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, පිහිටුවා ඇති එම තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන සංඛ්‍යාව එක් එක් ප්‍රධාන නගරය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3240/'12

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අදාළව;

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වනවිට පවතින ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකුට දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3264/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කොරියානු භාෂා ප්‍රවීණතා විභාගයට පෙනී සිටීම සඳහා 2012 අගෝස්තු මස 20 වැනි දින සිට ප්‍රවේශපත් නිකුත් කළ මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානවලින් නිකුත් කර ඇති අයදුම්පත් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 වර්ෂයේදී කොරියානු භාෂා ප්‍රවීණතා විභාගය වෙනුවෙන් නිකුත් කළ අයදුම්පත් සංඛ්‍යාව, එයට පෙනී සිටි සංඛ්‍යාව, සමත් වූ සංඛ්‍යාව සහ එම විභාග ප්‍රතිඵල මත කොරියානු රජයේ විදේශ රැකියා අවස්ථාවන් ලැබූ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2011 වර්ෂයේ කොරියානු භාෂා ප්‍රවීණතා විභාගයේ අයදුම්පත් ලබා ගැනීමට විදේශ ගමන් බලපත්‍රය අනිවාර්ය කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3652/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හබරණ හා උඩවලව ප්‍රදේශවලින් අල්ලා ගන්නා ලද අලි පැටවුන් විසි දෙදෙනෙකු පමණ නීති විරෝධී ලෙස විවිධ ව්‍යාපාරිකයින්ගේ සහ දේවාල හා විහාරස්ථාන භාරයේ රඳවාගෙන සිටින බවත්;

(ii) ඊට එරෙහිව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් කිසිදු පියවරක් ගෙන නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉහත (අ)(i) හි සඳහන් කරුණ සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගැනීමට හේතු කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 'හීලෑ අලි ඇතුන්ගේ සංගමය' නමින් සමාගමක් ලියාපදිංචි කර ඇති බව දන්නේද;

(ii) මෙම සංගමයේ නිලධාරීන් විසින් අලි ඇතුන් තම භාරයේ තබා ගනිමින් සමාජයට වැරදි ආදර්ශ ලබා දෙන බව පිළිගන්නේද;

(iii) හීලෑ අලි ඇතුන්ගේ සංගමයේ නිලධාරීන් විසින් තම භාරයේ අලි ඇතුන් රඳවා ගැනීම ජාවාරමක් බවට පත්කරගෙන ඇති බැවින්, ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වා එම තත්ත්වය වැළැක්වීම සඳහා අවශ්‍ය කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3709/'13

ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා සඳහා අනුමත කොට ඇති උපදේශකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) වත්මන් ජනාධිපතිවරයා යටතේ උපදේශකවරුන් පත්කර ඇති ක්ෂේත්‍ර කවරේද;

(iii) එම උපදේශකවරුන් වෙනුවෙන් පසුගිය වර්ෂ 3 තුළ දැරූ පිරිවැය කවරේද;

(iv) එම පිරිවැයට සාපේක්ෂව එම උපදේශකවරුන් ප්‍රමාණවත් කාර්යභාරයක් ඉටුකර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4163/’13

ගරු පී. හැරිසන් මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011.11.26 වැනි දින හෝ ඊට ආසන්න දිනයකදී අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේ ගින්නක් ඇතිවූ බවත්;

(ii) එම ගින්නෙන් අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ හා ලිපිලේඛනවලින් විශාල ප්‍රමාණයක් ගිනිබත්වීම හෝ අලාභානිවීම සිදු වූ බවත්;

(iii) නඩු භාණ්ඩ හා ලිපිලේඛන අලාභානි වීම නිසා එම අධිකරණයේ විභාග වෙමින් පැවතුන නඩු වර්ෂ ගණනාවක් ප්‍රමාදවීම්වලට ලක්ව ඇති බවත්;

(iv) එම ගින්නෙන් පසුව සමහර නඩු ලිපිගොනු අස්ථානගතවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේ සිදුවූ එම ගින්නට හේතුව කවරේද;

(ii) එම ගින්නට හේතුව ගිනි තැබීමක් නම්, ඒ හා සම්බන්ධ පුද්ගලයින් අත්අඩංගුවට ගනු ලැබුවේද;

(iii) එසේ නම්, එම පුද්ගලයින් සම්බන්ධයෙන් දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම සිදුවීම් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වනු ලබන පොලිස් ස්ථානය කවරේද;

(v) එම පරීක්ෂණවල ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4280/’13

ගරු දුනේෂ් ගන්කන්ද මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 නොවැම්බර් මස 19 වැනි දින සිට 2013 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ අමාත්‍යවරුන්ට (කැබිනට් සහ කැබිනට් නොවන), නියෝජ්‍ය අමාත්‍යවරුන්ට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) එම චෝදනා එල්ල වී ඇති අමාත්‍යවරුන්ගේ, නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නම් කවරේද;

(iii) එම එක් එක් අමාත්‍යවරයාට, නියෝජ්‍ය අමාත්‍යවරයාට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාට එරෙහිව ඇති චෝදනා වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පැමිණිලි සම්බන්ධයෙන් එකී කොමිෂන් සභාව මගින් විමර්ශන අවසන් කර ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) විමර්ශන අවසන් කොට ඇති පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ඉදිරි පියවර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) මේ දක්වා විමර්ශන අවසන් කර නොමැති පැමිණිලි සම්බන්ධව කඩිනම්ව සහ විධිමත්ව විමර්ශන කටයුතු සිදු කරන්නේද;

(iv) ඒ සඳහා ගතවේ යැයි අපේක්ෂා කරන කාල සීමාව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4599/'13

ගරු මොහමඩ් අස්ලම් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ නගර සංවර්ධන හා නගර අලංකාර කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කොළඹ 10, මාලිගාවත්ත පෙදෙසේ ඇපල්වත්ත, ආර්. බී. වත්ත යන ස්ථානවල පිහිටි පදිංචිකරුවන්ගේ නිවාස ඉවත් කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් තීරණයක් ගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඉහත ස්ථානවලින් කඩා ඉවත් කිරීම පිණිස හඳුනාගෙන තිබෙන නිවාස සහ අනෙකුත් දේපළ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සහ දේපළවල හිමිකරුවන්ගේ නම්, ලිපිනයන් සහ වරිපනම් අංක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4660/'13

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— මහාමාර්ග, වරාය සහ නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය පිටත වටරවුම් මාර්ගය ඉදිකිරීම සඳහා වූ ව්‍යාපෘතිය දැනටමත් ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එය ආරම්භ කරනු ලැබූයේ කවදාද;

(iii) ව්‍යාපෘතිය නිම කිරීම සඳහා යෝජිත දිනය කවදාද;

(iv) නොඑසේ නම්, එකී ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබීමට නියමිතව ඇත්තේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ත්‍රිකුණාමලය පිටත වටරවුම් මාර්ග ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ සමාගමේ නම කවරේද;

(ii) එකී සමාගමට ප්‍රදානය කළ කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතියට අරමුදල් සපයන ආකාරය කවරේද; (එනම් එයට අරමුදල් සපයනුයේ ණයක් සහ/ හෝ ප්‍රදානයක් මගින්ද)

(ii) ව්‍යාපෘතියට අරමුදල් සැපයීම සඳහා වගකිවයුතු පාර්ශ්වයන්ගේ ප්‍රභේදනය සහ එක් එක් පාර්ශ්වය විසින් සපයනු ලබන මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2660/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි විශ්වවිද්‍යාල ඇතුළු සෑම උසස් අධ්‍යාපන ආයතනයකම සියලු පහසුකම්වලින් සමන්විත අංග සම්පූර්ණ භාෂාගාර පිහිටුවා තිබේද;

(ii) එසේ නම්, එම භාෂාගාර පිහිටුවීමේ වැඩසටහනට අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3241/'12

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නාගරික සංවර්ධන අධිකාරියට අදාළව;

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකුට දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3653/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ විල්පත්තුව ජාතික වනෝද්‍යානය හා අඛණ්ඩව බැඳී ඇති වීරක්කුලිචෝලෙ - එළුවන්කුලම යෝජිත රක්ෂිතයට අයත් තබ්බෝව අභය භූමිය හා බැඳී පවතින අක්කර 250 ක භූමි ප්‍රදේශයක් එච්.වී.ඒ.ෆාම් ආයතනය මගින් මේ වන විට බැකෝ යන්ත්‍ර ආධාරයෙන් එළිපෙහෙළි කරන බවත්;

(ii) රජයට අයත් මෙම වනාන්තර භූමිය සඳහා ව්‍යාජ ඔප්පුවක් සකසා ඇති බවත්;

(iii) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් විසින් මෙම වනාන්තර භූමිය සඳහා සකස් කර ඇති ව්‍යාජ ඔප්පුව සඳහා නීත්‍යානුකූලභාවයක් ලබාදීමට කටයුතු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනය වනාන්තර භූමිය තුළ සිදු කරනු ලබන ඉදිකිරීම් සඳහා නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) වනජීවී හා පුරාවිද්‍යා රක්ෂිතද පිහිටි ඉහත සඳහන් ප්‍රදේශයේ එච්.වී.ඒ.ෆාම් ආයතනය පවත්වා ගෙන යාම නිසා දැඩි පරිසර හානියක් සිදුවන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම තත්ත්වය වැළැක්වීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3718/'13

ගරු අනුර දිසානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ හතර තුළ එක් එක් කන්නයේදී රජය මගින් මිලදී ගන්නා ලද මුළු වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වී ප්‍රමාණයන් එක් එක් කන්නයේ සමස්ත නිෂ්පාදනයෙන් කවර ප්‍රතිශතයක්ද;

(iii) පසුගිය වර්ෂයේදී වී මිලදී ගැනීම සඳහා වැය කළ මුදල කොපමණද;

(iv) පසුගිය වර්ෂ හතර තුළ වී මිලදී ගැනීම සඳහා මුදල් සපයා ගනු ලැබූ ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එක් එක් කන්නයේ මිලදී ගන්නා ලද වී තොග, එක් එක් අවස්ථාවන්හිදී අලෙවිකරන ලද මිල ගණන්, මිලදී ගත් පුද්ගලයින් සහ එම එක් එක් පුද්ගලයා මිලදී ගත් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත වී මිලදී ගැනීම් හරහා ලබා ඇති ලාභය / අලාභය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අලාභයක් සිදුවී තිබේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4164/'13

ගරු පී. හැරිසන් මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින ආයුර්වේද වෛද්‍යවරුන්ගේ කාණ්ඩවල නම් කවරේද;

(ii) එම එක් එක් කාණ්ඩයට අයත් වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාණ්ඩ අතර සිටින සර්වාංග විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට 2013 දක්වා කාල සීමාව තුළ ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් බලපත්‍ර ලබාදී ඇති සමස්ත සම්බාහන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව ඒවායේ ලිපිනයන් සමග දිස්ත්‍රික්ක මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට අවසර ලබා දී ඇති වෛද්‍යවරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) ආයුර්වේද දෙපාර්තමේන්තුවට අමතරව වෙනත් ආයතන මගින් සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යෑම සඳහා බලපත්‍ර ලබා දී තිබේ නම්, එම ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා තිබිය යුතු අවම වෘත්තීය සුදුසුකම් කවරේද;

(ii) එවැනි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන ස්ථානයක තිබිය යුතු තත්ත්වයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4661/'13

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළියෙහි ඉහළ උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේ කවදාද;

(ii) ඉහත ක්‍රීඩා සංකීර්ණය ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව භාර දෙන ලද සමාගමේ නම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු කිරීම සඳහා ඉහත සමාගම තෝරාගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නුවරඑළියෙහි ඉහළ උන්නතාංශ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම සඳහා වන ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය කොපමණද?

(ii) එම ව්‍යාපෘතියට අරමුදල් සපයන පාර්ශ්වය හෝ පාර්ශ්වකරුවන්ගේ නම් කවරේද;

(iii) අරමුදල් සැපයීම සඳහා එක් පාර්ශ්වයකට වඩා වැඩි ප්‍රමාණයක් සම්බන්ධ වී සිටින්නේ නම්, එම පාර්ශ්ව අරමුදල් සපයන ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2014 ජූනි මස 20 වැනි සිකුරාදා)

2905/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු දිනයේ සිට අද දක්වා ශ්‍රී ලංකාව පාලනය කර ඇති රජයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත (i)හි සඳහන් කරන ලද එක් එක් රජයෙහි ආරම්භයේ සිට අවසානය දක්වා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 1985, 1995, 2005 සහ 2012 යන වර්ෂවලදී එක් අමාත්‍යවරයෙකු වෙනුවෙන් දරන ලද සාමාන්‍ය පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් සභා පනත මගින් පළාත් සභාවන්හි අමාත්‍යවරු සංඛ්‍යාව සීමාකර ඇති ආකාරයට, කැබිනට් අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව නීතියෙන් සීමා නොකිරීමට හේතුව කවරේද;

(ii) කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව වැඩි කිරීමෙන් රටට යහපතක් වී තිබේද; එසේ නැතහොත්, එමගින් රටට වැඩි බරක් පැටවී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?